අ.පො.ස. උසස් පෙළ

# බෞද්ධ ශිෂ්ටාචාරය II

Channel NIE

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය**

**බෞද්ධ ශිෂ්ටාචාරය II** **කාලයඃ පැය තුනයි**

උපදෙස්ඃ පුනරීක්ෂණ

- **ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි.**
- **I කොටසේ ප්‍රශ්න තුනක් ඇත. ඉන් ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතු ය.**
- **II කොටසේ ප්‍රශ්න පහකි. ඉන් ප්‍රශ්න තුනක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය.**
- **ඒ අනුව දෙවන ප්‍රශ්න පත්‍රයේ ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.**
- **සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමි වේ.**

බෞද්ධ ශිෂ්ටාචාරය විෂයය සංවර්ධනය සඳහා පිළිතුරු සැපයීමේ දී නිවැරදි පිළිතුරක් නිර්මාණය කරගන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ඔබට සපයන අත්වැලක් ලෙස මෙම ප්‍රශ්න හා පිළිතුරු ඉදිරිපත් කර ඇත.

## I කොටස

01) (i) වානප්‍රස්ථ ආශ්‍රමයට අයත් කාර්යයන් කෙටියෙන් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) මානව සංහතියේ ඒකත්වය තහවුරු කිරීමෙහි ලා බුදුසමය ඉදිරිපත් කරන ජීවවිද්‍යාත්මක සාධක පෙන්වා දෙන්න. (ලකුණු 03 යි)

(iii) පූරණ කස්සප ශාස්තෘවරයාගේ අකිරියවාදය ගෙනහැර දක්වන්න. (ලකුණු 04 යි)

(iv) බුද්ධකාලීන භාරත සමාජය තුළ ප්‍රධාන ජීවන වෘත්තියක් වශයෙන් වෙළෙඳාම ක්‍රියාත්මක වූ බවට සාධක පහක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි)

(v) අජිත කේසකම්බලගේ ආගමික ඉගැන්වීම් මගින් සමාජ සදාචාරයට සිදුවන අහිතකර බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

02) (i) බුදුරජාණන්වහන්සේ අරහං නාමයෙන් හැඳින්වීමට හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) බුදුරජාණන්වහන්සේගේ ත්‍රිවිද්‍යා ඥානය නම් කොට එහි අර්ථ ලියන්න. (ලකුණු 03 යි)

(iii) බුදුරජාණන්වහන්සේ විශිෂ්ට ශාස්තෘත්වයක් ප්‍රකට කළ බවට සාධක **හතරක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 04 යි)

(iv) සැරියුත් තෙරුන්වහන්සේගේ චරිත ලක්ෂණ තුළින් ලැබිය හැකි ආදර්ශ **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(v) හොඳ නරක වෙන්කර ගැනීමට යොදාගත හැකි නිර්ණායක **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

03) (i) සහස්සම්පි චේ වාචා යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02 යි)

(ii) එම ගාථාවේ අර්ථය නිවැරදි ව ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(iii) සුභාසිතා ච යා වාචා යන්නට කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 04 යි)

(iv) පුද්ගලයාගේ ආර්ථික පරිහානියට හේතුවන සාධක හතරක් පෙන්වා දෙන්න. (ලකුණු 05යි)

(v) බුදුසමයේ දැක්වෙන චතුර්විධ සුඛය හඳුන්වා දෙන්න. (ලකුණු 06 යි)

## II කොටස

- ප්‍රශ්න පහකි. තුනකට පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලැබෙන ලකුණු සංඛ්‍යාව 20 කි.

04) (i) නූතන සමාජය මුහුණ දෙන ප්‍රධාන සමාජ ගැටලු අවම කර ගැනීමට පඤ්චශීල ප්‍රතිපදාවෙන් ලැබිය හැකි පිටිවහල පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

(ii) පුද්ගල ස්වාමිත්වය පිළිබඳ බුදුසමයේ ආකල්පය වෙනත් සමකාලීන ආගමික ඉගැන්වීම්වලින් වෙනස්වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

05) (i) ධර්මාශෝක රජතුමාගේ ශාසනික මෙහෙය අගය කරන්න. (ලකුණු 10 යි)

(ii) පැරණි භාරතයේ පැවැති බෞද්ධ විශ්වවිද්‍යාලවලින් සිදු වූ ධර්මශාස්ත්‍රීය සේවය ඇගයීමට ලක් කරන්න (ලකුණු 10 යි)

06) (i) ජපානයට බුදුදහම හඳුන්වාදීමේ ඓතිහාසික පසුබිම ගෙනහැර දක්වන්න. (ලකුණු 10 යි)

(ii) ජපානයේ සංස්කෘතිය බුදුසමයෙන් පෝෂණය වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

07) (i) බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ දී යොදාගත් විවිධ මුද්‍රා සනිදර්ශනව හඳුන්වාදෙන්න. (ලකුණු 10 යි)

(ii) භික්ෂු සමාජයේ පාරිශුද්ධිය පිණිස ධර්ම සංගායනාවලින් ලැබුණු පිටිවහල නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

08) (i) ශ්‍රී ලාංකේය ස්තූප නිර්මාණයේ දී භාරතයේ ස්තූප කලාවේ මූලික ආකෘතිය නවීකරණය වූ ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

(ii) ශ්‍රී ලාංකික සමාජධර්ම බුදුසමයේ අභාසයෙන් සැකසුණු අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)